# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,156 - 2019 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2019.12.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.-* (i) විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 ජනවාරි මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජනවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1 - B 81591— 5,403 (2019/12)
F 1 -

# පළාත් සභා නිවේදන

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ 2007 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ සමුපකාර සමිති ඈවර කර අවසන් කිරීම

පහත සඳහන් සමුපකාර සමිති ඉදිරියේ පෙන්වා ඇති දින සිට ඈවරකර අවසන් කරන ලද බව සබරගමුව පළාත් සභාවේ 2007 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 57(2) වගන්තිය යටතේ දන්වා සිටිමි.

ඒ. එම්. පී. අරන්දර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සබරගමුව පළාත.

**ඈවර කටයුතු අවසන්කර ගැසට් පත්‍රයේ පළ කිරීමට ඇති සමිති ලේඛනය**

| අනු අංකය | ලියාපදිංචි අංකය | සමිතියේ නම | ලිපිනය | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|
| 01 | කෑ/611 | සීමාරහිත තලේවෙල සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | තලේවෙල, හෙට්ටිමුල්ල | 2017.08.03 | කෑගල්ල |
| 02 | කෑ/640 | සීමාරහිත හුරීමලුව සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | හුරීමලුව, රඹුක්කන | 2017.08.03 | කෑගල්ල |
| 03 | කේ/ඊ/159 | සීමාරහිත ජීවාන සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | ජීවාන, දේවාලේගම | 2017.08.10 | කෑගල්ල |
| 04 | කෑ/460 | සීමාරහිත දීවෙල කන්දෙමුල්ල සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | දීවෙල, කන්දෙමුල්ල, දීවෙල, පල්ලේගම | 2017.09.27 | කෑගල්ල |
| 05 | කේ/725 | සීමාරහිත දූරණියගල නාගරික සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | දූරණියගල | 2018.02.27 | කෑගල්ල |
| 06 | කෑ/506 | සීමාරහිත දුණුමාල සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | දුණුමාල වරකාපොල | 2018.04.18 | කෑගල්ල |
| 07 | කෑ/512 | සීමාරහිත අල්ගමවත්ත ගම සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | අල්ගමවත්ත ගම, අල්ගම | 2018.04.18 | කෑගල්ල |
| 08 | කෑ/687 | සීමාරහිත පානකාව සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | පානකාව, කෑගල්ල | 2018.07.22 | කෑගල්ල |
| 09 | කෑ/767 | සීමාරහිත රුවන්වැල්ල නගර බැංකු සමුපකාර සමිතිය | කෙලින්වීදිය, රුවන්වැල්ල | 2018.02.12 | කෑගල්ල |
| 10 | කෑ/440 | සීමාරහිත පිලාඩුව සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | පිලාඩුව, වරකාපොල | 2018.02.12 | කෑගල්ල |
| 11 | කෑ/480 | සීමාසහිත කිණිගොඩ කෝරලේ ගැමි කාර්මිකයින්ගේ සමුපකාර සමිතිය | රඹුක්කන | 2019.03.25 | කෑගල්ල |
| 12 | කෑ/873 | සීමාසහිත රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධිත නිලධාරීන්ගේ සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රඹුක්කන | 2019.04.29 | කෑගල්ල |
| 13 | කෑ/509 | සීමාසහිත මල්මඩුව රබර් නිපදවන්නන්ගේ හා අලෙවි කරන්නන්ගේ සමුපකාර සමිතිය | මල්මඩුව, කොටියාකුඹුර | 2019.02.28 | කෑගල්ල |
| 14 | කෑ/711 | සීමාසහිත හොලොම්බුව අලවල කුඩා රබර්වතු හිමියන්ගේ හා රබර් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | අලවල, තුංතොට | 2019.01.31 | කෑගල්ල |

| අනු අංකය | ලියාපදිංචි අංකය | සමිතියේ නම | ලිපිනය | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|
| 15 | කේ/291 | සීමාසහිත ලෝල්ගොඩ කුළගත ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය | ලෝල්ගොඩ, මහපල්ලේගම | 2019.02.15 | කෑගල්ල |
| 16 | කෑ/547 | සීමාසහිත පුවක්මොටේ සකසුරුවම් හා ණය ගණු දෙණු පිළිබඳ සමුපකාර සමිතිය | පුවක්මොටේ, රඹුක්කන | 2019.09.14 | කෑගල්ල |
| 17 | කෑ/599 | සීමාසහිත ඔත්නාපිටිය රබර් නිපදවන්නන්ගේ හා අලෙවි කරන්නන්ගේ සමුපකාර සමිතිය | ඔත්නාපිටිය, නෙලුන්දෙනිය | 2019.09.22 | කෑගල්ල |
| 18 | කෑ/789 | සීමාසහිත කෑගල්ල දිස්ත්‍රික් ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සකසුරුවම් හා ණයගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | ආයුර්වේද රෝහල, රංවල, කෑගල්ල | 2019.09.22 | කෑගල්ල |
| 19 | කෑ/494 | සීමාරහිත මාළිගාතැන්න සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | මාළිගාතැන්න, උස්සාපිටිය | 2019.09.22 | කෑගල්ල |
| 20 | කෑ/399 | සීමාරහිත පැහැනිපැද්දර සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | පැහැනිපැද්දර, අරණායක | 2019.09.22 | කෑගල්ල |
| 21 | කෑ/709 | සීමාරහිත දෙවනගල සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | දෙවනගල, හෙම්මාතගම | 2019.09.22 | කෑගල්ල |
| 22 | කෑ/639 | සීමාරහිත අඹුවන්ගල සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමූපාකාර සමිතිය | අඹුවන්ගල, ඉඹුල්ගස්දෙණිය | 2019.09.23 | කෑගල්ල |
| 23 | කෑ/933 | සීමාසහිත නිල්වක්ක සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය | නිල්වක්ක, කෑගල්ල | 2019.09.23 | කෑගල්ල |
| 24 | කෑ/530 | සීමාරහිත ඉහල මායින්නොලුව සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | ඉහළ මායින්නොලුව, දොරවක | 2017.02.08 | කෑගල්ල |

12-883

---

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ 2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 20(4) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

කොළඹ 09, දෙමටගොඩ, වේළුවන පෙදෙස, අංක 143 දරන ස්ථානයෙහි චතුරි සුලක්ෂණා වික්‍රමනායක යන අයගේ හිමිකාරීත්වය යටතේ පවත්වාගෙන යාම සඳහා 2018.07.04 දින බස්නාහිර පළාතේ, පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ඩබ්. ඒ. 210801 අංකය යටතේ ලියාපදිංචි කර ඇති සැලොන් චතුරි නමැති ව්‍යාපාරය, එම ව්‍යාපාර නාමය යටතේ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන නොයන බව විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු මා වෙත ඉදිරිපත් වී ඇත.

එබැවින්, සැලොන් චතුරි නමැති ව්‍යාපාර නාමය, ව්‍යාපාර නාම ලේඛනයෙන් ඉවත් නොකිරීමට හේතු ඇතොත් ඒ හා සම්බන්ධයෙන් වන විරෝධතා මෙම නිවේදනයට අදාළ දැන්වීම් *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මාසයක් ඇතුළත මා වෙත ඉදිරිපත් විය යුතු බවත්, එසේ විරෝධතා ඉදිරිපත් නොවන්නේ නම් බස්නාහිර පළාතේ 2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 20(5) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සැලොන් චතුරි යන ව්‍යාපාර නාමය ව්‍යාපාර නාම ලේඛනයෙන් ඉවත් කරනු ලබන බවත් මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. අයි. යූ. එදිරිසිංහ,
බස්නාහිර පළාතේ පළාත් ව්‍යාපාර නාම
ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙහි
රෙජිස්ට්‍රාර්.

2019 දෙසැම්බර් මස 10 වැනි දින,
නුගේගොඩ, පාගොඩ පාර, අංක 17 හි පිහිටි,
බස්නාහිර පළාතේ පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ
දෙපාර්තමේන්තුවෙහි දී ය.

12-896/1

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාතේ 2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 20(4) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

අවිස්සාවේල්ල, රත්නපුර පාර, 1 වන පටුමග, අංක 27 දරන ස්ථානයෙහි කත්‍රි ආරච්චිගේ දොන් ටියුඩර් ඔගස්ටින් රන්මල් ශාන්තප්‍රිය සහ කැකුල් කොටුවගේ දෝන දීප්ති බර්නඩීන් ප්‍රීති ඔගස්ටීන් යන අයගේ හිමිකාරිත්වය යටතේ පවත්වාගෙන යාම සඳහා 1992.06.20 දින බස්නාහිර පළාතේ, පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ඩබ් 30037 අංකය යටතේ ලියාපදිංචි කර ඇති ආට්ලයිට් ෆවුන්ඩ්‍රි ඇන්ඩ් කාස්ටින් ඉන්ඩස්ට්‍රීස් නමැති ව්‍යාපාරය, එම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන නොයන බව විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු මත මා වෙත ඉදිරිපත් වී ඇත.

එබැවින්, ආට්ලයිට් ෆවුන්ඩ්‍රි ඇන්ඩ් කාස්ටින් ඉන්ඩස්ට්‍රීස් නමැති ව්‍යාපාර නාමය, ව්‍යාපාර නාම ලේඛනයෙන් ඉවත් නොකිරීමට හේතු ඇතොත් ඒ හා සම්බන්ධයෙන් වන විරෝධතා මෙම නිවේදනයට අදාළ දැන්වීම් *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මාසයක් ඇතුළත මා වෙත ඉදිරිපත් විය යුතු බවත්, එසේ විරෝධතා ඉදිරිපත් නොවන්නේනම් බස්නාහිර පළාතේ 2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 20(5) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ආට්ලයිට් ෆවුන්ඩ්‍රි ඇන්ඩ් කාස්ටින් ඉන්ඩස්ට්‍රීස් යන ව්‍යාපාර නාමය ව්‍යාපාර නාම ලේඛනයෙන් ඉවත් කරනු ලබන බවත් මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. අයි. යූ. එදිරිසිංහ,
බස්නාහිර පළාතේ පළාත් ව්‍යාපාර නාම
ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙහි
රෙජිස්ට්‍රාර්.

2019 දෙසැම්බර් මස 10 වැනි දින,
නුගේගොඩ, පාගොඩ පාර, අංක 17 හි පිහිටි
බස්නාහිර පළාතේ පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ
දෙපාර්තමේන්තුවෙහි දී ය.

12-896/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.